## පළමුවන දේව ප්‍රකාශනය

උත්පත්ති 18:20-32

උත්පත්ති පොතෙන් ගත් කොටසකි.

**"ස්වාමීනි, නැවත වාද කිරීමට ඉදිරිපත් වීම ගැන මා සමග නොකිපෙන සේක් වා."**

සමිඳාණන් වහන්සේ ආබ්‍රහම්ට කතා කොට, "සොදොම් සහ ගොමොරා නුවරවලට විරුද්ධ ව නගින චෝදනා කෙතරම් දරුණු ද? ඔවුන්ගේ පාපය කෙතරම් බරපතල ද? එබැවින් මම දැන් බැස ගොස් මා වෙත පමුණුවා ඇති චෝදනාවල ඇත්ත නැත්ත විභාග කරමි"යි වදාළ සේක. එවිට අමුත්තෝ එතැනින් නික්ම සොදොම් බලා පිටත් වූ හ. එහෙත්, ආබ්‍රහම් සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ම නැවතී සිටියේ ය. ආබ්‍රහම් ද උන් වහන්සේට සමීප වී, "සැබැවින් ම ඔබ අදමිටුන් සමග දමිටුන් වත් වනසන සේක් ද? හොඳයි! නුවරෙහි දමිටුන් පණස්දෙනෙක් සිටිත් නම්, මේ පණස්දෙන නිසා නුවර නොවනසා ඊට සමාව නොදෙන සේක් ද? අදමිටුන් සමග දමිටුන් වනසාලීමේ අදහස ඔබෙන් දුරින් දුරු වේ වා! අදමිටුන් සමග දමිටුන් එක ම මිම්මෙන් මැනීම ඔබේ කැමැත්ත නො වේ වා! මුළු මිහි තලයේ විනිශ්චයකාරයාණෝ සාධාරණ ලෙස යුක්තිය ඉටු නොකරන සේක් දැ"යි ඇසී ය. එවිට සමිඳාණන් වහන්සේ උත්තර දෙමින්, "සොදොම් නුවරෙහි දමිටුන් පණස්දෙනෙක් සිටිත් නම් ඔවුන් නිසා ඒ මුළු නුවරට මම සමාව දෙන්නෙමි"යි වදාළ සේක. ආබ්‍රහම් නැවතත් කතා කරමින්, "අළු හා දූවිල්ල පමණක් වූ මා, මාගේ සමිඳාණන් වහන්සේ සමග කතා කිරීමට තරම් නිර්භීත වීම ගැන මට සමාවන්න. හොඳයි! නුවරෙහි දමිටුන් සතළිස් පස් දෙනෙක් සිටිත් නම් පස්දෙනෙකු අඩු නිසා ඔබ මුළු නුවර වනසාලන සේක් දැ"යි ඇසී ය. "එහි දමිටුන් සතළිස් පස් දෙනෙක් සිටිත් නම්, මම එය නොවනසමි"යි උන් වහන්සේ වදාළ සේක. ආබ්‍රහම් යළිත් කතා කරමින්, "ඇතැම් විට එහි දමිටුන් සතළිස්දෙනෙකු සිටින්නට පුළුවනැ"යි කී ය. "ඒ සතළිස්දෙනා නිසා මම නුවර නොවනසමි"යි උන් වහන්සේ උත්තර දුන් සේක. ආබ්‍රහම් නැවතත් කතා කරමින්, "ස්වාමීනි, ඔබ මා සමග නොකිපෙන සේක් වා! මම නැවතත් කතා කරමි. හොඳයි! එහි තිස්දෙනෙකු පමණක් සිටින්නට පුළුවනැ"යි කී ය. "ඒ තිස්දෙනා නිසා මම නුවර නොවනසමි"යි උන් වහන්සේ ද උත්තර දුන් සේක. ආබ්‍රහම් තවදුරටත් කතා කරමින්, "සමිඳාණන් වහන්සේ සමග වාද කිරීමට ඉදිරිපත් වීම ගැන කමා වන්න. හොඳයි! එහි දමිටුන් විසිදෙනෙක් පමණක් ඇතැ යි හිතමු"යි කී ය. "ඒ විසිදෙනා නිසා මම නුවර නොවනසමි"යි උන් වහන්සේ පිළිතුරු දුන් සේක. එවිට ආබ්‍රහම් යළිත් මෙසේ කී ය: "සමිඳාණන් වහන්සේ මා සමග නොකිපෙන සේක් වා! තව එක වරක් පමණක් කතා කිරීමට මට අවසරයි. හොඳයි! එහි දමිටුන් දහදෙනෙක් පමණක් ඇතැ යි හිතමු." "ඒ දහදෙනා නිසා මම නුවර නොවනසාලමි"යි උන් වහන්සේ උත්තර දුන් සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 138:1-3, 6-8

පිළිතුර: සමිඳුනි, ඔබ අපට පිළිතුරු දුන් සේක.

ගීය: සමිඳුනි, හද පත්ලෙන් ඔබට තුති කරන්නෙමි. සුරදූතුන් ඉදිරියෙහි ඔබට ගී ගයා ඔබ පසසන්නෙමි. ඔබේ ශුද්ධ මාලිගාව දෙස බලා නමස්කාර කරමින් ඔබේ කරුණා ගුණය සහ විශ්වාසවන්තභාවය නිසා ඔබේ නාමයට තුති පුදන්නෙමි. ඔබේ නාමයත්, ආඥාත් උත්තරීතර බව ඔබ පෙන්වූ සේක.

මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන් සේක; මාගේ සිත සවි කොට, මට ධෛර්යය දුන් සේක. සමිඳාණෝ උසස් නමුත්, පහත් අය සලකන සේක. එහෙත්, උඩඟු අය දුර සිට ම හැඳින ගන්න සේක.

මම විපත්ති මැද හැසිරෙමි නමුත් ඔබ මා රැක බලාගන්න සේක. ඔබ මාගේ සතුරන්ගේ උදහසට විරුද්ධ ව ඔබේ හස්තය දිගු කරන සේක. ඔබේ සුර'තින් ඔබ මා ගළවන සේක. සමිඳාණෝ මා සම්බන්ධ ව අදහස් කරන දේ ඉටු කරන සේක. සමිඳුනි, ඔබේ ප්‍රේමය සදා පවත්නේ ය. ඔබ ඇරඹුවා වූ දේ නිම කළ මැනව.

## දෙවන දේව ප්‍රකාශනය

කොලොස්සි 2:12-14

පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන් වෙත ලියන ලද හසුනෙන් කොටසකි.

**"දෙවියන් වහන්සේ අප සැම ක්‍රිස්තුන් වහන්සේ සමඟ ජීවත් කර අපේ සියලු පව් කමා කරන සේක."**

මන්ද, බව්තීස්ම-ස්නාපනයේ දී ඔබ උන් වහන්සේ සමඟ වළලනු ලැබ, උන් වහන්සේ මරණයෙන් උත්ථාන කළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරී බලය තුළ ඇති විශ්වාසය කරණකොටගෙන ක්‍රිස්තුන් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබුවහු ය. ඔබ පව්කාරයන් නිසාත්, අචර්මඡේදිතයන් වූ නිසාත් මැරී සිටි නමුත්, දෙවියන් වහන්සේ ඔබ ක්‍රිස්තුන් වහන්සේ සමඟ ජීවත් කර ඔබේ සියලු පව් කමා කළ සේක. අණපණත්වලට අප බැඳ තැබූ අපට අහිතකර ඇපකරය උන් වහන්සේ අවලංගු කළ සේක. එය කුරුසියේ ඇණ ගසා අපෙන් ඉවත් කළ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහන් 1:14,12

ආලේලූයා! ආලේලූයා!
ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක.
උන් වහන්සේ අදහා ගත් අයට, දේව දරුවන් වීමේ වරම උදා කළ සේක.
ආලේලූයා!
හෝ රෝම 8:15
ආලේලූයා! ආලේලූයා!
මන්ද, ඔබ ලබා ඇත්තේ "අබ්බා, පියාණෙනි"යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 11:1-13

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"ඉල්ලන්න, ඔබට දෙනු ලබන්නේ ය."**

ජේසුස් වහන්සේ එක් තැනක යාච්ඤා කරමින් සිටි සේක. එය නිම වූ පසු උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක් තැනැත්තෙක් කතා කොට, "ස්වාමීනි, ජොහන් තම ගෝලයන්ට ඉගැන්වූ ලෙස, අපටත් යාච්ඤා කරන්නට ඉගැන්නුව මැනවැ"යි කීවේ ය. උන් වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක: "ඔබ යාච්ඤා කරන කල මෙසේ කියන්න: 'පියාණෙනි, ඔබ වහන්සේගේ නාමයට ගෞරව වේ වා, ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේ වා. අපේ දිනපතා ආහාරය දිනෙන් දින අපට දුන මැනව. අපේ පව් අපට

කමා කළ මැනව; මන්ද, අපට ණයගැති ව සිටින හැමට අප කමා වන බැවිනි. අප පරීක්ෂාවට නොපමුණුවනු මැනව.' " තවද උන් වහන්සේ ඔවුන්ට කතා කරමින්, "ඔබ අතර මිතුරෙකු ඇති තැනැත්තෙක් මහ රෑ ඔහු වෙත ගොස්, 'මිත්‍රය, මට රොටි තුනක් දෙන්න; ගමනක් යන මාගේ මිත්‍රයෙක් මා වෙත අවුත් සිටියි; ඔහුට දෙන්න කිසිවක් මා ළඟ නැතැ'යි කියන්නේ නම්, ගේ ඇතුළේ සිට ඒ මිතුරා, උත්තර දෙමින්, 'මට කරදර නොකරන්න, දැන් දොර වසා තිබේ; මාගේ දරුවෝ ද මා සමඟ ඇඳේ නිඳා සිටිති; නැඟිට යමක් ඔබට දෙන්නට නොහැකි ය'යි කියයි ද? මම ඔබට මෙය කියමි, ඔහු සිය මිත්‍රකම සලකා නැඟිට ඔහු ඉල්ලන දේ ඔහුට නොදෙතත් ඔහුගේ ලජ්ජා නැති පෙරැත්තය නිසා නැඟිට, වුවමනා පමණ ඔහුට දෙනු ඇතැ"යි වදාළ සේක. "මම ද ඔබට කියමි, ඉල්ලන්න, ඔබට දෙනු ලැබේ; සොයන්න, ඔබට සම්බ වේ; තට්ටු කරන්න, ඔබට දොර අරිනු ලැබේ. මන්ද ඉල්ලන හැමට ලැබේ; සොයන්නාට සම්බ වේ; තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ. ඔබ අතරෙන් කවර පියෙක් තම පුත්‍රයා මාළුවකු ඉල්ලූ විට මාළුවා වෙනුවට සර්පයෙකු දෙයි ද? නොහොත් බිත්තරයක් ඉල්ලූ විට ඔහුට ගෝනුස්සකු දෙයි ද? මෙසේ අයහපත් වූ ඔබ, ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නාහු නම්, ඊට කොපමණ වැඩියෙන්, ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මයාණන් නොදෙන සේක් ද?"

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.